සැ. යු. 2011.05.06 දින පළ වූ අංක 1705 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,706 - 2011 මැයි මස 13 වැනි සිකුරාදා - 2011.05.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| පනත් ... ... ... ... | — | වස්තු හංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 198 | නොතාරිස් ලැයිස්තු ... ... ... | 198 |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. — ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 අප්‍රේල් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත 2011 අප්‍රේල් මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේඛයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලුම දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මැයි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මැයි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

197- B 80223 —2,200 (2011/05)
D1–

# දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - තෙල්දෙනිය**

කාලය ඉකුත් වූ නඩු වාර්තා විනාශ කිරීම

තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලදුව, අවසන් කරන ලද වර්ෂ පහකට (5) වඩා පැරණි පහත උපලේඛනයේ සඳහන් නඩු වාර්තා 2011.01.17 දිනෙන් පසුව මෙම අධිකරණ භූමියේ දී පුලුස්සා විනාශ කිරීමට සූදානම් කර ඇත.

මෙම නඩු සම්බන්ධයෙන් යම් පාර්ශවකරුවෙකු තමාට අවශ්‍ය නඩුවක සම්පූර්ණ පිටපතක් හෝ එහි යම් කොටසක් ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා ඉල්ලුම් පත්‍රය 2010.12.15 දිනට පෙර මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේ ඉල්ලීමක් නොවුනහොත් පහත නඩු අංක ලේඛනයේ සඳහන් නඩු වාර්තා 2011.01.17 දිනෙන් පසුව මෙම අධිකරණ භූමියේ දී පුළුස්සා විනාශ කරන බව මෙයින් දන්වනු ලැබේ.

අයි. ඩී. පී. ලියනගේ,
මගේස්ත්‍රාත් - තෙල්දෙණිය.

2010 සැප්තැම්බර් මස 29 වැනි දින,
තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

05 - 327

# නොතාරිස් ලැයිස්තු

**නොතාරිස් ආඥාපනත (107 වැනි අධිකාරය)**

නොතාරිස් ආඥා පනත (107 වැනි අධිකාරය) 11 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

01. ගාල්ල, තවලම, තවලම දකුණ, " වෙද මැදුර", අංක 155 හි පදිංචි, හෙට්ටි ආරච්චිගේ රේණුකා දමයන්ති මෙනවිය, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

02. මතුගම, මීගහතැන්න, කෙලින් වීදිය, අංක 04 හි පදිංචි, රත්නායක වීරකෝන්ගේ සන්ධ්‍යා කුමාරි මහත්මිය, කළුතර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

03. කෝට්ටේ, ඇතුල් කෝට්ටේ, අලකේෂ්වර පාර, අංක 70/1 හි පදිංචි, දොන් මානුවෙල්ගේ ජනිත චාමර විමලදාස මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

04. යාපනය, පසයියූර්, පළමු හරස් වීදිය, අංක 27/1 හි පදිංචි, මුඩියප්පු රෙමඩියස් මහතා, යාපනය අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

පී. බී. අබේකෝන්,
ලේකම්.

2011 මාර්තු මස 28 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ.

05-305

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.